# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.16 පැය 2220 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/751/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. විදෙස් රටක නිෂ්පාදිත පිස්තෝල අවියක් සහ මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තෙලිකඩ පොලිස් ස්ථානය.

2025.04.16 වන අද දින උදෑසන කාලයේ තෙලිකඩ පොලිස් වසමේ රත්ගම ප්‍රදේශයේදී තෙලිකඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදේස රටක නිෂ්පාදිත පිස්තෝල අවියක්, එම පතොරම් 06 ක්, පතරොම් ගැබක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්, හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සහ මුදල් රුපියල් 11,100/= ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තෙලිකඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2025.04.16 වන අද දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ බබාපුල්ල හන්දියේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 765 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදන් වීමක් - කිරිදිවැල පොලිස් වසම.

2025.04.16 වන අද දින සවස් කාලයේ කිරිදිවැල පොලිස් වසමේ රංවල ප්‍රදේශය හරහා ගලා බසින කැලණි ගගේ කොග්ගල තොටුපොලේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදන් වී ඇති බවට කිරිදිවැල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**දියේ ගිලී අතුරුදන් වූ පුද්ගලයා වයස අවුරුදු 37 වූ පමුණුවිල, මාකොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් නාවික කොට්ඨාසයේ සහය ඇතිව කිරිදිවැල පොලිසිය විසින් දියේ ගිලී අතුරුදහන් වූ පුද්ගලයා සොයා සෝදිසි මෙහෙයුම් සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මරදන්කඩවල පොලිස් වසම.

2025.04.16 වන අද දින දහවල් කාලයේ මරදන්කඩවල පොලිස් වසමේ කැකිරාව තිරප්පනය මාගර්යේ මරදන්කඩවල ප්‍රදේශයේදී කැකිරාව දෙස සිට තිරප්පනය දෙසට ධාවනය වූ ලොරි රථයක් එම දෙසටම ඉදිරියෙන් ගමන් කරමින් සිටි පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු මරදන්කඩවල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 74 ක් වූ නිවාස 30, මරදන්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පස්වාත් මරණ පරීක්ෂණය සඳහා අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මරදන්කඩවල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - රස්නායකපුර පොලිස් වසම.

2025.04.16 වන අද දින දහවල් කාලයේ රස්නායකපුර පොලිස් වසමේ රස්නායකපුර බෝවත්ත මාගර්යේ කඩිගාව ප්‍රදේශයේදී රස්නායකපුර දෙස සිට බෝවත්ත දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු එම ස්ථානයේම මියගොස් ඇති අතර පසුපැදිකරු බරපතල තුවාල ලබා නිකවැරටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ කොට්ටාව, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නිකවැරටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. රස්නායකපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**